**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.12.08 වන දින පැවැති මාසික මහ සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 දෙසැම්බර් මස 08 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්ෂ්මිණී දසනායක මැතිතුමිය. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.11.10)**

2022.11.10 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2022.11.10 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව හා මැණික් සංස්ථාව එක්ව සියලු පතල් පරීක්ෂාවකට ලක් කිරීමේ දී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිටහේන නම් ආදාහනාගාර ඉඩමට එහා ඉඩමේ බාන්ස් රත්වත්ත මාවත , හිරුණි බස්නායක යන බලපත්‍රලාභියා විසින් කපමින් තිබූ මැණික් පතල් දෝනා ආදාහනාගාර ඉඩම තුළට ඇවිත් තිබූ බවත් , එනම් දැනට භාවිතා කරන මායිම ගල්වැටිය වන අතර එක පැත්තකින් අඩි 2ක් මායිමෙන්

ඇතුලටත් තව පැත්තකින් අඩියක් ඇතුලටත් ඇවිත් තිබූ බවත් , එම පරික්ෂාවට මැණික් සංස්ථාවේ පරීක්ෂක නිලධාරී ප්‍රියන්ත මහතා , කාර්මික නිලධාරී යෝගරත්න මහතා , සංවර්ධන නිලධාරී සංජීව මහතා හා සභාවේ කම්කරුවන් සම්බන්ධ වූ බවත් , සභාවේ අය පතලට බැස බලා මැනුම් සියල්ල ලබා ගත් බවත් , ඒ අවස්ථාව වන විටත් යම් ප්‍රමාණයක ඉල්ලම් ගොඩට දමා තිබූ බවත් , එම අවස්ථාවේ ම පතල නවත්වා නීති උපදෙස් ලබා ගත් බවත් , මෙම ඉඩමේ නඩුවක් පවතින බවත් , අනිත් පිරිස මායිම ගල් වැටට උඩින් පවතින බව පැවසූ බවත් , ඔවුන් එකඟතාවයකට නොපැමිණි බවත් , පුද්ගලික මැනුමකට එම පිරිස ඉල්ලීමක් කළ බවත් , නඩුවක් පැවතීම නිසා ඒ සඳහා ඉඩ ලබා නොදුන් බවත් , අධිකරණයෙහි අවසරයක් නැතිව පුද්ගලික මැනීමක් සිදු කළ නොහැකි බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ අනිත් පාර්ශවයට මෙම ඉඩමේ කලින් මැනපු පිඹුරක් තිබෙනවා ද යන්න ය.

අධිකරණ නියෝගයකින් ඇවිත් ඇති බවත් , පිඹුරක් පවතින බවත් , මෙම ඉඩමේ නඩුවක් අධිකරණයේ පවතින නිසා මැනීමට අපේ නඩුවෙන් අවසර ලබා දිය යුතු බවත් , නීතිඥ මහතාගෙන් උපදෙස් ලබා ගත් බවත් , එහි දී ඊළඟ නඩු වාරයට සියලු දෙනාම ඉදිරිපත් කර මැනීමට අවසරයක් ඉල්ලන ලෙස නීතිඥමහතා ප්‍රකාශ කළ බවත් ය. තව ද අනිත් පැත්තෙන් ගත් විට සභාව මේ නඩුවෙහි විත්තිකාරයන් බවත් , එනිසා වෙන කණ්ඩායමකට මැනීමක් සිදු කිරීමට අවසර දීමට සභාවට අවසරයක් නැති බවත් , ඉල්ලම් පස් වීමට පෙර සම්පත් පවතීනම් ඉල්ලම් සෝදා ලබා ගන්නා ලෙස මැණික් සංස්ථාවෙන් ලිපියක් නිකුත් කළ බවත් , ඒ අනුව ප්‍රාදේශීය සභාව , මැණික් සංස්ථාව , ඉඩම් අයතිකාරයන් යන සියලු දෙනාම සිටින ස්ථානයක ඉල්ලම් ගැරීම් සිදු කළ අතර එහි දී පහත ආකාරයට මැණික් හමු වූ බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

| දිනය | මැණික් සංඛ්‍යාව | බර කැරට් |
|---|---|---|
| 2022.11.24 | කැබලි 40 | කැරට් 251.85 |
| 2022.11.25 | කැබලි 12 | කැරට් 121.02 |
| 2022.11.26 | කැබලි 13 | කැරට් 84.25 |
| 2022.11.27 | කැබලි 08 | කැරට් 52.95 |
| 2022.11.28 | කැබලි 06 | කැරට් 42.25 |

සියලුම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ගැරීම සිදු කළ බවත් , සියලු නිරීක්ෂණ ලබා ගත් බවත් , මෙම ගල් සීල් තැබූ බවත් , මැණික් සංස්ථාවේ තක්සේරුව ලබා ගෙන මෙම ගල් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා භාගයක් ඒ අයටත් අනිත් ටික සංස්ථාවේ තැන්පත් කිරීමටත් ඊට පසුදිනම මැණික් සංස්ථාවෙන් යෝජනා කළ බවත් , තමන් එයට එකඟ නොවූ බවත් , ඒ සම්බන්ධව නීතිඥ ප්‍රදීප් මංගල මහතාගෙන් නීති උපදෙස් ලබා ගත් බවත් , අධිකරණයෙ නිසි අවසරයක් නැතිව වෙනත් ක්‍රියාමාර්ගයකට නොයන ලෙස එතුමා පැවසූ බවත් , එනිසා එම ගල් සංස්ථාවේ තැන්පත් කර ඇති බවත් , අද ලේකම්තුමා හා සංජීව මහතා සමඟ ඒ සම්බන්ධව සාකච්ඡාවක් මැණික් සංස්ථාවෙහි පැවැත්වෙන බවත් , අධිකරණ ක්‍රියාවලියකින් සභාවට ලැබිය යුතු රාජ්‍ය අදායම ලැබීමට එහි දී ලේකම්තුමා එකඟ වන බවත් , ඉල්ලන් තව කාලයක් තිබුනානම් පස් වීමට තිබූ බවත් , එම අවස්ථාවේ කළ යුතු උපරිම දේ නීති උපදෙස් ගෙන සිදු කළ බවත් , සියලු තොරතුරු පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමාවත් දැනුවත් කළ බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**03.සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා ස්වාධීන මන්ත්‍රීවරයෙකු වශයෙන් මින් ඉදිරියට කටයුතු කරන බව ලිපියකින් දන්වා ඇති බව ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදී.

**04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

I. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>

**01.** 2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පුහුණු සැළැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 01</u>**

2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පුහුණු සැළැස්ම අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ප්‍රසම්පාදන සැළැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 02</u>**

2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ප්‍රසම්පාදන සැළැස්ම අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** 2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 03**

2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**04.** 2023 වර්ෂය වෙනුවෙන් ස්ථාවර කාරක සභා හතර සඳහා නව කමිටු සාමාජිකයින් පත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 04**

2023 වර්ෂය වෙනුවෙන් ස්ථාවර කාරක සභා හතර සඳහා නව කමිටු සාමාජිකයින් පහත පරිදි පත් කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය. එමෙන්ම 2018-11-15 වන දින පැවති මාසික මහා සභාවේ තීරණ අංක 01 යටතේ මුදල් කමිටුව වෙත ලබා දී ඇති ලක්ෂ 10 ක් දක්වා වූ මුදල් අනුමත කිරීමේ බලය මෙම මුදල් කමිටුවටද හිමිවන අතර මුදල් කමිටුවම ටෙන්ඩර් මණ්ඩල කමිටුව වශයෙන් පිළිගැනීමටත් තීරණය විය.

**1. මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම - ගරු සභාපතිතුමන් ඇතුළුව**

1. ගරු උපසභාපති - ඩී.වී.උපාලි මැතිතුමා.
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා.
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා.
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා.
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය.
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.පියසේන මැතිතුමා.
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා.

**2. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව - ගරු සභාපතිතුමන් ඇතුළුව**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.පියසේන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී මැතිතුමිය

**3. කාර්මික සේවා කමිටුව - ගරු සභාපතිතුමන් ඇතුළුව**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා.
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා.
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා.
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.ආර්.ශ්‍රිතායාල මැතිතුමිය.
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා.
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.රගවන් මැතිතුමා.
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා.
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා.

**4. පරිසර හා පොදු පහසුකම් කමිටුව - ගරු සභාපතිතුමන් ඇතුළුව**

1. ගරු උපසභාපති - ඩී.වී.උපාලි මැතිතුමා.
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා.
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය.

6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා.
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය.
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා.

**05.** 2023 වර්ෂය සඳහා KH - 3881 ජීප් රථය සඳහා ඩීසල් ලීටර් 900 ක මාසික ඉන්ධන සීමාවක් අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා ඉන්ධන භාවිතය පිළිබඳව විමසන ලදී.

මෙම ඉන්ධන සීමාව ගිය වර්ෂයේ දී අනුමත වූ ඉන්ධන සීමාවම බවත් , ඉන්ධන භාවිතය බොහෝ සේ සීමා කර ඇති බවත් , මාසිකව ඩීසල් ඉන්ධන සීමාව 500 ඉක්මවා පරිහරණය කර නොමැති බවත් , මෙම ඉන්ධන සීමාව අඩු වූවාට කිසිම ගැටළුවක් නොමැති බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**<u>තීරණ අංක 05</u>**

පසුගිය වර්ෂය පරිදිම 2023 වර්ෂය සඳහා ද KH - 3881 ජීප් රථය සඳහා ඩීසල් ලීටර් 900 ක මාසික ඉන්ධන සීමාවක් අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව සභා සම්මත විය.

**06.** 2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැළැස්ම, මහජන සෞඛ්‍යය හා ප්‍රජා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සැළැස්ම හා දෛනික කසල රැස් කිරීමේ මාර්ග සැළැස්ම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 06</u>**

2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැළැස්ම, මහජන සෞඛ්‍යය හා ප්‍රජා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සැළැස්ම හා දෛනික කසල රැස් කිරීමේ මාර්ග සැළැස්ම සඳහා අනුමැතිය ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** 2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන සැළැස්ම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07</u>**

2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන සැළැස්ම සඳහා අනුමැතිය ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** 2023 වර්ෂය වෙනුවෙන් සකස් කරනලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැසි ජල කාණු නඩත්තුව, සුසාන භූමි නඩත්තුව හා මාර්ග පද්ධතිය නඩත්තු කිරීමේ සැළැස්ම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා පවසා සිටියේ කාණු පද්ධතිය හරස් කර ඉදිකිරීම් සිදු කර ඇති බවත් , ඒවා ඉවත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් ය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එවැනි අනවසර ඉදිකිරීම් පිළිබඳව පැමිණිලි ලැබුන විට කාර්මික නිලධාරි පරීක්ෂා කර බලා ඉවත් කිරීමට කටයුතු කරන බවත් , එවැනි අනවසර ඉදිකිරීම් සම්බන්ධව ලිඛිතව සභාවට පැමිණිලි කරන ලෙසත් ය.

ලෙල්ලොපිටිය හන්දියෙහි පවතින දැඩි වාහන තදබදය හේතුවෙන් හදිසි රෝගියෙකු රැගෙන ගිලන් රථයකටවත් මාර්ගයෙහි ගමන් කළ නොහැකි බවත් , ත්‍රීවීල් රථ ගාල හා බස් නැවතුම්පළ එම ස්ථානයේ පැවතීම ද මෙම වාහන තදබදයට හේතු වන බවත් , අනාගතයේ ඇති විය හැකි විශාල අනතුර වළක්වා ගැනීම සඳහා මාර්ගයේ දෙපස කාණු වලට කොන්ක්‍රීට් සැලැබ් දමා යෝග්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවටත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටින ලදී

ඒ සම්බන්ධව ලිඛිතව විධායක ඉන්ජිනේරුතුමා වෙත ලිපියක් යැවීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.තව දුරටත් අදහස දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ආර්.ඩී.එක මගින් කාපට් කළ මාර්ග වල ගැටළුවක් ඇති බවත් , සභාවේ ද මුදල් නොමැති නිසා ඒ තත්වය පවතිද්දී සභාවට එම මාර්ග භාර ගත නොහැකි බවත් , වැඩ අවසන් කර ලබා දෙනවානම් භාර ගත හැකි බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ සන්නස්ගම පාළුගම්පල මාර්ගය හරහා මලදොළවල් ගලා ගෙන යන බවත් , මාර්ග වල බෝක්කු නොදමා කාපට් දමා තිබීම ඊට හේතුව බවත් , එනිසා සන්නස්ගම ගාමන්ට් එකෙහි යට පාර සම්පූර්ණයෙන් ම ජල පහරට යට වන බවත් , මේ හේතුවෙන් ගාමන්ට් එකේ බැම්ම පුපුරා ඇති බවත් , සභාවෙන් බෝක්කු දැමීම

නිසා මෙම ගැටළුවට පොඩි හෝ විසඳුමක් ලැබුනු බවත් ය.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය ද එම කරුණු සත්‍ය බව පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මීදිගහමුල්ල ගොඩගම මාර්ගයේ අමුණ අසල ඇති බැම්ම පුපුරා කැඩී ගෙන යන බැවින් මේ සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බව ය.

මේ කාරණා දෙක සම්බන්ධව ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලෙස කාර්මික නිලධාරීතුමාව දැනුවත් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**<u>තීරණ අංක 08</u>**

2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැසි ජල කාණු නඩත්තුව, සුසාන භූමි නඩත්තුව හා මාර්ග පද්ධතිය නඩත්තු කිරීමේ සැළැස්ම සඳහා අනුමැතිය ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** 2023 වර්ෂය වෙනුවෙන් මහා සභා රැස්වීම පැවැත්වෙන දින වශයෙන් සෑම මසකම 2 වන බ්‍රහස්පතින්දා දිනය නම් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 09</u>**

2023 වර්ෂය වෙනුවෙන් මහා සභා රැස්වීම පැවැත්වෙන දින වශයෙන් පහත පරිදි සෑම මසකම 2 වන බ්‍රහස්පතින්දා දිනය නම් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

( ජනවාරි 12, පෙබරවාරි 09, මාර්තු 09, අප්‍රේල් 20 (අප්‍රේල් 13 නිවාඩු දිනයක් බැවින්) , මැයි 11, ජූනි 08, ජූලි 13, අගෝස්තු 10 , සැප්තැම්බර් 14, ඔක්තෝබර් 12, නොවැම්බර් 09, දෙසැම්බර් 14 )

**10.** 2023 වර්ෂය වෙනුවෙන් කාර්තු හතරට අදාළව විගණන කළමනාකරණ කමිටු පැවැත්වෙන දින වශයෙන් මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් මාසවල අවසාන සතියේ බ්‍රහස්පතින්දා දිනයන් නම් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 10</u>**

2023 වර්ෂය වෙනුවෙන් කාර්තු හතරට අදාළව විගණන කළමනාකරණ කමිටු පැවැත්වෙන දින වශයෙන් පහත පරිදි මාර්තු, ජූනි, සැප්තැම්බර්, දෙසැම්බර් මාසවල තුන්වන සතියේ බ්‍රහස්පතින්දා දිනයන් නම් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

( මාර්තු 23, ජූනි 22, සැප්තැම්බර් 21, දෙසැම්බර් 21 )

**11.** 2023 වර්ෂයට ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර ඇති ඇමුණුමෙහි සඳහන් සැපයුම්කරුවන් ලියාපදිංචි සැපයුම්කරුවන් ලෙස පිළිගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 11</u>**

2023 වර්ෂයට ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර ඇති ඇමුණුමෙහි සඳහන් සැපයුම්කරුවන් ලියාපදිංචි සැපයුම්කරුවන් ලෙස පිළිගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** 2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා පත්කර ඇති පහත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත බලය පැවරීමට යොජනා කරමි.

| | | | |
|---|---|---|---|
| **1.** | සභාපති | - | ජී.ඒ.ජී.බී.ප්‍රේමරත්න මයා |
| **2.** | සාමාජික | - | ඩබ්.එම්.ඩබ්.කුමාරතුංග මයා |
| **3.** | සාමාජික | - | බී.ඒ.ඒ.ඊ.ජයවර්ධන මිය |
| **4.** | සාමාජික | - | ජේ.පී.රුක්ෂලා මිය |
| **5.** | සාමාජික | - | එස්.එම්.ප්‍රියදර්ශනී මිය |
| **6.** | සාමාජික | - | ආර්.ඒ.දීපානි මිය |
| **7.** | සාමාජික | - | එච්.එච්.ඩී.එම්.ගුණසේකර මිය |
| **8.** | සාමාජික | - | එම්.කේ.ටී.උදාරනී මිය |
| **9.** | සාමාජික | - | ඩී.පී.එස්.සංජීව මයා |
| **10.** | සාමාජික | - | එම්.එම්.එස්.එන්.මිණිපුර මිය |
| **11.** | සාමාජික | - | එස්.රත්නාවතී මැණිකේ මිය |
| **12.** | සාමාජික | - | එච්.කේ.ආර්. ද සොයිසා මිය. |
| **13.** | සාමාජික | - | ආර්.වී.ඕ.උදයකාන්ති මිය. |
| **14.** | සාමාජික | - | කේ.එච්.ජේ.ජයසිංහ මිය. |

| | | | |
|---|---|---|---|
| **15.** | සාමාජික | - | එච්.පී.එච්.රම්.විජේසිරි මිය |
| **16.** | සාමාජික | - | බී.එම්.එන්.පී.ගුණතිලක මිය. |
| **17.** | සාමාජික | - | ආර්.ඒ.ඩී.ආර්.රණසිංහ මිය. |
| **18.** | සාමාජික | - | කේ.ඒ.ආර්.කුරුප්පුආරච්චි මයා. |
| **19.** | සාමාජික | - | කේ.ජේ.උපනන්ද මයා. |

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් පත්කර එවනු ලබන නිලධාරීන් දෙදෙනෙක්
ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙක්

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ඉහත කමිටුව සඳහා පත්කරන ගරු මන්ත්‍රීවරු ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමන් සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 12**</u>

2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා ගරු මන්ත්‍රී දෙපළ ඇතුළු පත්කර ඇති ඉහත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත බලය පැවරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.**මේ සමඟ අමුණා ඇති පරිපූරක අයවැය වාර්තාව සභා සම්මත කර ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ අයවැයක් ඉදිරිපත් කළ පසුව පරිපූරක අයවැයක් ඉදිරිපත් කළේ ඇයි යන්න ය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම පරිපූරක අයවැය මෙම වර්ෂයේ ඉදිරි කටයුතු වෙනුවෙන් සකස් කර ඇති බවත් , ගිය මාසයේ සභා සම්මත වූයේ ඊළඟ වර්ෂයට අදාලව සකස් කළ අයවැය වාර්තාව බවත් ය.

<u>**තීරණ අංක 13**</u>

පහත පරිපූරක අයවැය ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

| බලාපොරොත්තු වන ආදායම් පිළිබඳ විස්තරය | | | බලාපොරොත්තු වන වියදම් පිළිබඳ විස්තරය | | |
|---|---|---|---|---|---|
| ආදායම් ශීර්ෂය | විස්තරය | ඇස්තමේන්තුව | වැය ශීර්ෂය | විස්තරය | ඇස්තමේන්තු ව |
| 1-71 | සේවක වැටුප් ප්‍රතිපූර්ණය | 11479980.00 | 101-1 | සේවක වැටුප් ගෙවීම | 11479980.00 |

**14.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වත්කම් උපලේඛන ( යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ / ලී බඩු හා සවි කිරීම් / ඉඩම් හා ගොඩනැගිලි / පුස්තකාල පොත් ) පිළියෙල කිරීම සඳහා සුදුසු මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 14**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වත්කම් උපලේඛන ( යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ / ලී බඩු හා සවි කිරීම් / ඉඩම් හා ගොඩනැගිලි / පුස්තකාල පොත් ) පිළියෙල කිරීම සඳහා පහත මණ්ඩලය පත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

| | | |
|---|---|---|
| කමිටු සභාපති | - එස්.රත්නාවතී මැණිකේ මිය | - සංවර්ධන නිලධාරී |
| සාමාජික | - බී.ඒ.ඒ.ඊ.ජයවර්ධන මිය | - සංවර්ධන නිලධාරී |
| සාමාජික | - බී.එම්.එස්.අයි.යෝගරත්න මයා | - කාර්මික නිලධාරී |
| සාමාජික | - බී.කේ.ඩබ්.එස්.විජේලතා මිය | - සංවර්ධන නිලධාරී |
| සාමාජික | - කපිල පෙරේරා මයා | - කාර්යාල කාර්යය සහායක |
| සාමාජික | - යූ.ජී.ඩී.ඩබ්.උඩගෙදර මිය | - ආදායම් පරීක්ෂක |

**15.**කිරිදි ඇල්ල දේශීය විදේශීය සංචාරකයින්ට නැරඹීම වෙනුවෙන් පහසුකම් සැපයීම සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ලබා දෙන ව්‍යාපෘති වාර්තාවට අනුකූලව ප්‍රාදේශීයව ටෙන්ඩර් කැඳවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය විමසා සිටියේ සභාවෙන් ව්‍යාපෘති වාර්තාවක් සකස් කළා ද යන්න ය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඒ අනුව ටෙන්ඩර් කළ යුතු බවත් ,

එනම් අපේ යෝජනාවක් අනුව පුද්ගලික අංශයෙන් ආයෝජකයන් සොයා ගත යුතු බවත් , එය නීත්‍යානුකූල බවත් , විස්තර ඊළඟ සභාවට ඉදිරිපත් කරන බවත් ය.

**<u>තීරණ අංක 15</u>**

කිරිදි ඇල්ල දේශීය විදේශීය සංචාරකයින්ට නැරඹීම වෙනුවෙන් පහසුකම් සැපයීම සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ලබා දෙන ව්‍යාපෘති වාර්තාවට අනුකූලව ප්‍රාදේශීයව ටෙන්ඩර් කැඳවීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ලේඛනාගාරයේ පැරණි ලේඛන හා ලිපිගොනු විශාල ප්‍රමාණයක් පැවතීම හා ලේඛනාගාරයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ලිපිගොනු පරීක්ෂා කර බලා අපහරණය කළ හැකි ලේඛන හා ලිපිගොනු විධිමත් ක්‍රියාපටිපාටිය ඔස්සේ අපහරණය කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය පවසා සිටියේ එම ලිපිගොනු වල මෘදු පිටපත් තබා ගැනීම සුදුසු බව ය. ලිපිගොනු පරීක්ෂා කර බලා අපහරණය කළ හැකි ලිපිගොනු පමණක් විධිමත් ක්‍රියාපටිපාටිය ඔස්සේ අපහරණය කිරීම සිදු කරන බවත් , මෘදු පිටපත් තබා ගැනීම අවශ්‍ය නොවන බවත් ගරු සභාපතිතුමා පෙන්වා දෙන ලදී.

**<u>තීරණ අංක 16</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ලේඛනාගාරයේ පැරණි ලේඛන හා ලිපිගොනු විශාල ප්‍රමාණයක් පැවතීම හා ලේඛනාගාරයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ලිපිගොනු පරීක්ෂා කර බලා අපහරණය කළ හැකි ලේඛන හා ලිපිගොනු විධිමත් ක්‍රියාපටිපාටිය ඔස්සේ අපහරණය කිරීම සඳහා පහත කමිටුව පත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

| | |
|---|---|
| ජී.ඒ.බී.ඩී.ප්‍රේමරත්න මයා | - ප්‍ර.ක.සේ.නිලධාරී |
| එස්.රත්නාවතී මැණිකේ මිය | - සංවර්ධන නිලධාරී |
| බී.ඒ.ඒ.ඊ.ජයවර්ධන මිය | - සංවර්ධන නිලධාරී |
| ඩී.එල්.එන්.දීපානි මිය | - සංවර්ධන නිලධාරී |
| එම්.ඒ.එස්.කුමාරි මිය | - සංවර්ධන නිලධාරී |
| ආර්.ඒ.ඩී.රවිහාරි රණසිංහ මිය | - සංවර්ධන නිලධාරී |
| විමර්ෂණ නිලධාරී | |
| ප්‍රජා සංවර්ධන නිලධාරී | |

**17.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු ලේඛනාගාරය විධිමත්ව හා විනිවිදභාවයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා ලේඛනාගාර ප්‍රතිපත්තිය සකස් කොට ඇති අතර එය ක්‍රියාත්මක කිරීමට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 17</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු ලේඛනාගාරය විධිමත්ව හා විනිවිදභාවයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා සකස් කළ ලේඛනාගාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**18.** පැල්මඩුල්ල සතිපොළ අසල රථ ගාලෙහි 2022 වර්ෂයේ අප්‍රේල් මස , මැයි මස , ජූනි මස , ජූලි මස පාසල් බස් රථ ගාල් කර ඇත්තේ පහත පරිදිය.

අප්‍රේල් මස - දින 06
මැයි මස - දින 4
ජූනි - දින 12
ජූලි - පාසල් නිවාඩු

එහෙයින් සභාවෙන් බස් රථ වලින් ගාස්තු අය කිරීමේ දී සහනයක් ලබා දෙන ලෙස පාසල් ළමුන් ප්‍රවාහන රියදුරු සංගමය විසින් ඉල්ලීමක් කර ඇත.ආදායම් පරීක්ෂතුමායගේ වාර්තාව සලකා බලා සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා පවසා සිටියේ වර්තමානයේ පාසල් බස් රථ වලින් පාසල් ළමුන්ගෙන් අය කරන ගාස්තු වැඩි කර ඇති බවත් , නිවාඩු දින පැවතිය ද පාසල් ළමුන්ගෙන් අදාල මුදල් මාසිකව අය කර ගන්නා බවත් , එනිසා රථ ගාලෙහි ගාස්තු අඩු නොකළ යුතු බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ පාසල් බස් රථ වලින් නිවාඩු මාස වල දී පවා පාසල් දරුවන්ගෙන් අදාල මුදල හෝ එමඟින් අඩක් ලබා ගන්නා බවත් , ඒ සමඟ බලන විට එක් බසයකින් සභාව අය කරන්නේ සුළු මුදලක් බවත් , එනිසා අදාල සම්පූර්ණ මුදලම සුපුරුදු පරිදි අය කිරීම සුදුසු බවත් ය.

**<u>තීරණ අංක 18</u>**

පාසල් බස් රථ ධාවනය සිදු වූයේ දින කිහිපයක් වුව ද පාසල් බස් රථ හිමිකරුවන් විසින් එම මාසයට ගෙවිය යුතු මුළු මුදල හෝ මුළු මුදලින් අඩක් පාසල් දරුවන්ගෙන් අය කර ගැනීම හේතුවෙන් , පැල්මඩුල්ල සතිපොළ අසල රථ ගාල ප්‍රයෝජනයට ගන්නා පාසල් බස් රථ වලින් සභාවට අය විය යුතු නිශ්චිත මාසික මුදල අය කර ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**19.**අක්කර 30 , බැරැණ්ඩුව , ලෙල්ලොපිටිය පදිංචි අඩු ආදායම්ලාභී ආර්.ඒ.අජන්තා රණතුංග යන අයට නිවාස අධාර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 19</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර අක්කර 30 , බැරැණ්ඩුව , ලෙල්ලොපිටිය පදිංචි අඩු ආදායම්ලාභී ආර්.ඒ.අජන්තා රණතුංග යන අයට නිවාස අධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**20.**කළුගම්මුල්ල , පැල්මඩුල්ල පදිංචි අඩු ආදායම්ලාභී නයනා දුල්මිණි කළුබෝවිල යන අයට සෙවිලි අධාර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 20</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර කළුගම්මුල්ල , පැල්මඩුල්ල පදිංචි අඩු ආදායම්ලාභී නයනා දුල්මිණි කළුබෝවිල යන අයට සෙවිලි අධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**II.** **<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** ගෝණකුඹුර තැපැල් කන්තෝරුව අසල මාර්ගය “ එච්.ඒ.ප්‍රේමරත්න මාවත “ නමින් නම් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 21</u>**

ගෝණකුඹුර තැපැල් කන්තෝරුව අසල මාර්ගය “ එච්.ඒ.ප්‍රේමරත්න මාවත “ නමින් නම් කිරීමට යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**02.** දෙමනගම්මන අම්පිටිය මාර්ගය “ සිරි පුර මාවත “ නමින් නම් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 22</u>**

දෙමනගම්මන අම්පිටිය මාර්ගය “ සිරි පුර මාවත “ නමින් නම් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**03.** දෙමනගම්මන මුල්ලේ ගෙදර මාර්ගය “ එච්.වී.ඩිංගිරි මහතා “ නමින් නම් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 23</u>**

දෙමනගම්මන මුල්ලේ ගෙදර මාර්ගය “ එච්.වී.ඩිංගිරි මහතා “ නමින් නම් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**04.**තිප්පල මාර්ගය “ආර්.කේ.චන්ද්‍රසේන මාවත” නමින් නම් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 24</u>**

දෙමනගම්මන තිප්පල මාර්ගය “ආර්.කේ.චන්ද්‍රසේන මාවත” නමින් නම් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**හදිසි යෝජනා**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමාගේ යෝජනා.</u>**

**01.**මෙම දින වල ජී.අයි.එස්.තාක්ෂණය ඔස්සේ මාර්ග සිතියම් ගත කිරීම හේතුවෙන් එයට මෙම මාර්ගය ඇතුලත් කර ගැනීමට හා ඊළඟ සභාවාරයට මෙම යෝජනාව ඇතුලත් කිරීමට ගියහොත් ඉදිරියට මසක් ගත වීම හේතුවෙන් හදිසි යෝජනා යටතේ මාර්ෂල් වැලිවත්ත මාර්ගය " භාෂා විශාරද මෛත්‍රීපාල මාවත " නමින් නම් කිරීමේ යෝජනාව ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 25</u>**
මාර්ෂල් වැලිවත්ත මාර්ගය " භාෂා විශාරද මෛත්‍රීපාල මාවත " නමින් නම් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.එච්.ලක්මිණී දසනායක මැතිතුමියගේ යෝජනා.</u>**

**01.**සන්නස්ගම වසමේ කුරුඳුවත්ත ඉඩමට යාබදව ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් පර්චස් 60 ක රක්ෂිතයට වෙන් කර ඇති ඉඩමේ ඇති ගස් තුනක් කපා ඉදිකිරීමක් සිදු කර ඇති අතර අවුරුදු 50 කට අධික කාලයක සිට ගමේ පවුල් 15 ක් පමණ හා සන්නස්ගම මැලිබන් ටෙක්ස්ටයිල් ආයතනය පානීය ජලය ලබා ගන්නා වටිනා උල්පත් ද එම හේතුවෙන් සිදී යාමේ ආවදානමකට ලක්ව ඇති බැවින් ඒ සම්බන්ධව අදාල ආයතන දැනුවත් කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ මෙම රක්ෂියෙහි විනාශයක් වනවානම් එය නතර කළ යුතු බව ය.

**<u>තීරණ අංක 26</u>**
මෙම යෝජනාව සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය , මධ්‍යම පරිසර අධිකාරිය , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලිපි මඟින් දැනුම් දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

**01.**මාරපන ශාස්ත්‍රෝදය හන්දිය මඩ හන්දිය සිට පනගම දෙසට මීටර් 50ක් පමණ දුරින් පිහිටි බෝක්කුව සමඟ ඇති විශාල හන්දිය ඉතාමත් අනතුරුදායක වන අතර , මේ වන විට ත්‍රී රෝද රථ සහ යතුරුපැදි කිහිපයක් රාත්‍රියේ දී කාණුවට වැටී අනතුරු සිදු වුනි.මෙම වංගුවේ සිට ශාස්ත්‍රෝදය හන්දිය පැත්තේ වංගුව පෙන්නුම් කරන පුවරු 3ක් පමණ සවි කිරීම සුදුසු බවත් , මාර්ගය පෙන්නුම් කරන සැලැස්මක් සකස් කර එය ප්‍රදර්ශනය කිරීම සුදුසු බවටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 27</u>**
ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර දැන්වීම් පුවරු හා මාර්ගය පෙන්නුම් කරන සැලැස්මක් සකස් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මාර්ග නම් කිරීමට ඇති නම් ප්‍රදේශවාසීන්ගේ එකඟතාවය ඇතිව එම මාර්ග නම් කර සභාවට ඉදිරිපත් කරන ලෙසත් , එම ඉල්ලීම් ප්‍රදේශයේ සමිති සමාගම් වල ඉල්ලීම් ලෙස ඉදිරිපත් කිරීමට ද හැකි බවත් , එවිට මාර්ග සිතියම් ගත කරන අවස්ථාවේ ම එම නම ඇතුල් කිරීමට හැකි බවත් , ජීවත්ව සිටින අයෙකුගේ නම ඇතුල් කළ නොහැකි බවට නීතියක් පවතින බවත් ය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** බැරැණ්ඩුව කොට්ඨාසයේ 93 කොටසේ පදිංචිව සිටින එන්.කේ.සරත් හේමචන්ද්‍ර , ඩී.සරත් කුමාර , කේ.වී.අමිල වෙන් , එච්.නිගල් ප්‍රියන්ත යන අයගේ නිවාස 2020 වර්ෂයේ ආපදාවන්ට ලක් වී ඇති අතර මෙම පුද්ගලයන්ගෙන් තිදෙනෙකුට නීලගම වත්තෙන් ඉඩම් ලබා දීමට තීරණය කර තිබූ නමුත් එම කටයුතු ද නිසියාකාරව සිදු නොවී ය.මේ හේතුවෙන් එම ජනයා ඉතා අසරණ තත්වයට පත් වී ඇති අතර යෝග්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 28</u>**
මෙම යෝජනාව සම්බන්ධව යෝග්‍ය වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම්තුමාට ලිඛිතව ඉල්ලීම් කර යැවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.කාරක වාර්ථා සලකා බැලීම - 2022-11-10 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

ඒ අනුව 2022-11-10 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07.2022-11-01 සිට 2022-11-30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

2022-11-01 සිට 2022-11-30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**08.**වෙනත් කරුණු.

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම.**

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ ආදාහනාගාර ඉඩම තුලට මැණික් පතල් දෝනා ඇවිත් තිබූ අවස්ථාවේ කටයුතු කළ ආකාරය නිවැරදි බව ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ බලංගොඩ ප්‍රදේශයේ දේශපාලන බලයක් ඇති පිරිසක් මෙම කටයුත්ත සිදු කර ඇති බවත් , මේ සම්බන්ධව සභාව කටයුතු කළ ආකාරය හරි ද යන්නත් ය.

දේශපාලන බලපෑම් බොහොමයක් පැමිණි බවත් , ඒ කිසිම දෙයකට එකඟතාවයක් ලබා නොදුන් බවත් , හැකි උපරිමයෙන් ම නීත්‍යානුකූල ආකාරයට අවශ්‍ය කටයුතු සිදු කළ බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගිතිය සාකච්ඡා කිරීම.**
- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමියහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙල්වනායගම් රගවන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2023 ජනවාරි මස 12 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තූති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තූති කතාව අවසන් කරන ලදී.

පෙ.ව.11.05 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022-12-08 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදීය.

ප්‍රාදේශීය සභා .................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා .................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2023-01-12 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව